මගේ අංකය - 8/3/2
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
ගිරිතලේ ව්‍යාපාරය
ජයන්තිපුර
2018.10.23

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ සියලුම සාමාජිකයින් වෙත

(9)

05 NOV 2018

## කන්න රැස්වීම් වාර්තාව - 2018/19 මහ කන්න රැස්වීම් වාර්තාව - ගිරිතලේ ව්‍යාපාරය

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් තුමන්ගේ ප්‍රධානත්වයෙන් 2018 ඔක්තොම්බර් මස 23 වන දින ප.ව. 2.00 ට ගිරිතලේ නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාවේදී 2018/19 මහ කන්නයේ කන්න රැස්වීම පවත්වන ලදි. පැමිණ සිටි සියලුම රාජ්‍ය නිළධාරීන් නේවාසික ව්‍යාපෘති කළමනාකාර තුමන් විසින් පිළිගැනීමෙන් හා අරමුණ පැහැදිලි කිරීමෙන් අනතුරුව රැස්වීම මෙහෙය වීම සඳහා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් තුමන් වෙත මූලාසනය භාර කරන ලදි.

සහභාගි වූවෝ :-

රාජ්‍ය නිළධාරීන් - 26 ගොවි සංවිධාන නිළධාරීන් - 57

1. පණ්ඩුක එස්.පි. අබේවර්ධන - දිස්ත්‍රික් ලේකම් - පොළොන්නරුව
2. සුජන්ත ඒකනායක - අතිරේක දිස්ත්‍රික් ලේකම් - පොළොන්නරුව
3. එස්.කේ.හේවාගම - වාරිමාර්ග අධ්‍යක්ෂ - පොළොන්නරුව
4. බී.එම්.සී.එච්. කුමාරිහාමි - ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්
5. ආර්.පී.උපාලි - නියෝජ්‍ය කෘෂි කර්ම අධ්‍යක්ෂ - අන්තර් පළාත්
6. ඒ.එම්.ඒ.අයි.බී.අබේසිංහ - ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - මින්නේරිය
7. ඩබ්.ඒ.එස්.ප්‍රියන්ත - නේවාසික ව්‍යාපෘති කළමනාකාරු - ගිරිතලේ
8. එම්.පි.ඒ.ජී.ප්‍රියදර්ශනි මැදඇල - ප්‍රාදේශීය නිළධාරී ගොවිජන සේවා මධ්‍යස්ථානය - ගිරිතලේ
9. ඊ.එම්.එස්.සී. කුමාර - ඉංජිනේරු සහකාර - මින්නේරිය
10. සී.එම්.ටී.ඩී.බී. චන්ද්‍රසේකර - ඉංජිනේරු සහකාර - මින්නේරිය
11. පී.ජේ.ආර්.පි. ජයවික්‍රම - ආයතන සංවර්ධන නිළධාරී - ගිරිතලේ
12. වයි.එම්.ඒ.එස්. කරුණාරත්න - සංවර්ධන නිළධාරී - ගිරිතලේ
13. ටී.එම්.සී.කුලතුංග - සංවර්ධන නිළධාරී - ගිරිතලේ
14. ඩබ්.ඒ.ජී.ඩී.වීරසිංහ - සංවර්ධන නිළධාරී - ගිරිතලේ
15. ඩබ්.ඒ.ජී.විජේසිංහ - සංවර්ධන නිළධාරී - ගිරිතලේ
16. ඊ.ආර්.ජී.සී.සරත් චන්ද්‍ර - කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ගිරිතලේ
17. එම්.පි.එස්.ඩී.එස්.ලංකාර්ථ - කෘෂිකර්ම උපදේශක කාර්යාලය - ගිරිතලේ
18. මල්ලිකා හේරත් - කෘ.ප.නි.ස - ගොවිජන සේවා මධ්‍යස්ථානය - ගිරිතලේ
19. ඩී.අයි.ටී.නිමල් අමරසිංහ - කෘ.ප.නි.ස - ගොවිජන සේවා මධ්‍යස්ථානය - ගිරිතලේ
20. එච්.එම්.කේ.හේරත් - කෘ.ප.නි.ස - ගොවිජන සේවා මධ්‍යස්ථානය - ගිරිතලේ
21. එච්.එම්.එස්.නිලන්ති හිටිනායක - කෘ.ප.නි.ස - ගොවිජන සේවා මධ්‍යස්ථානය - ගිරිතලේ
22. ජේ.ඒ.රම්‍යලතා ජයසිංහ - කෘ.ප.නි.ස - ගොවිජන සේවා මධ්‍යස්ථානය - ගිරිතලේ
23. ඩබ්.ඒ.එල්.ගයානි වික්‍රමආරච්චි - කෘ.ප.නි.ස - ගොවිජන සේවා මධ්‍යස්ථානය - ගිරිතලේ
24. ඩී.ආර්.ඉන්ද්‍රාවති මැණිකේ - කෘ.ප.නි.ස - ගොවිජන සේවා මධ්‍යස්ථානය - ගිරිතලේ
25. ජී.ඩී.ටී.කුමාර - දිස්ත්‍රික් අලවි නිළධාරී - ලක් පොහොර සමාගම
26. ආනන්ද ජයසේකර - කළමනාකාරු - ජාතික මූලික අධ්‍යයන ආයතනය

සහභාගී වූ ගොවි සංවිධාන නිළධාරීන්

1. පි.ආර්.ජයරත්න -සභාපති - 48 බෙදුම් ඇළ ගොවි සංවිධානය
2. එච්.ඒ.ඩී.ශාන්ත ගුණසේකර -සභාපති - කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය
3. ජී.ජී.සෝමරත්න -සභාපති - චන්දනපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය
4. ඒ.අසිස් -සභාපති - මුස්ලිම්ගම බෙදුම් ඇල ගොවි සංවිධානය
5. ආර්.ඒ.රූපසිංහ -සභාපති - පුරාණ ගිරිතලේගම බෙදුම් ඇල ගොවි සංවිධානය
6. පි.එම්. ආනන්ද වික්‍රමසූරිය -සභාපති - උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය
7. බි.එම්.රංජිත් බංඩාර -සභාපති - නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය
8. ආර්.ඒ. නිමල් රූපසිංහ -සභාපති - අග්බෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය
9. එම්.ජී.රූපසිංහ -සභාපති - ජයන්තිපුර බෙදුම් ඇල ගොවි සංවිධානය
10. ආර්.ඊ.එම්.අබේරත්න බණ්ඩා -සභාපති - මහසෙන්පුර බෙදුම් ඇල ගොවි සංවිධානය
11. ඩබ්.එම්.දයාවංශ -සභාපති - සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය
12. ඩබ්.ඒ.පොඩිරාළහාමි -සභාපති - පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය
13. ජී.එම්.එම්.සෝමරත්න මල්ලව -සභාපති - විජය බෙදුම් ඇල ගොවි සංවිධානය
14. ආර්.එම්.පි.රත්නායක -ලේකම් - විජය බෙදුම් ඇල ගොවි සංවිධානය
15. එන්.චන්ද්‍රකුමාර -ලේකම් - පැරණි ජනපද බෙදුම් ඇල ගොවි සංවිධානය
16. ආර්.ජී.සිරිසේන -ලේකම් - මහසෙන්පුර බෙදුම් ඇල ගොවි සංවිධානය
17. කේ.සුනිල් ප්‍රේමරත්න -ලේකම් - උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය
18. ආර්.ජී.ශිරෝමිනි පෙරේරා -ලේකම් - චන්දනපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය
19. ඊ.ඩී.නිලන්ති එදිරිසිංහ -ලේකම් - බැදිවැව බෙදුම් ඇල ගොවි සංවිධානය
20. ඩී. ආර් නිලන්ත දසනායක -ලේකම් - 48 බෙදුම් ඇළ ගොවි සංවිධානය
21. පුංචි බණ්ඩාර -ලේකම් - කඩවලවැව බෙදුම් ඇළ ගොවි සංවිධානය
22. ජී.ඒ. දයාරත්න -ලේකම් - සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය
23. වයි.ජී.සිරිවර්ධන -භාණ්ඩාගාරික- අග්බෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය
24. ආර්.එම්.මානෙල් පෙරේරා -භාණ්ඩාගාරික -මහසෙන්පුර බෙදුම් ඇල ගොවි සංවිධානය
25. ඩී.ඩබ්.හෙට්ටිවත්ත -භාණ්ඩාගාරික- පුරාණ ගිරිතලේගම බෙදුම් ඇල ගොවි සංවිධානය
26. ඩබ්.කේ.ඉංදික පුෂ්පකුමාර -භාණ්ඩාගාරික- බැදිවැව බෙදුම් ඇල ගොවි සංවිධානය
27. වයි.ජී. චන්ද්‍රරත්න -භාණ්ඩාගාරික- පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය
28. එච්.ඒ.පොඩිබංඩාර -භාණ්ඩාගාරික- නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය
29. යු.එච්.මුදියන්සේ -භාණ්ඩාගාරික - විජය බෙදුම් ඇල ගොවි සංවිධානය
30. පි.කේ.ජී.සරත් කුමාර -භාණ්ඩාගාරික - කඩවලවැව බෙදුම් ඇළ ගොවි සංවිධානය
31. ආර්.හින්නි මහත්තයා -භාණ්ඩාගාරික - සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය
32. එච්.ඒ.ඩබ්.ලාල් හෙට්ටිආරච්චි -භාණ්ඩාගාරික- උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය
33. එල්. ශ්‍රියානි ධම්මිකා -භාණ්ඩාගාරික- පැරණි ජනපදය බෙදුම් ඇල ගොවි සංවිධානය
34. සාෆීර් -භාණ්ඩාගාරික- මුස්ලිම්ගම ගොවි සංවිධානය
35. අයි.පී.ජයරත්න -භාණ්ඩාගාරික- 48 බෙදුම් ඇළ ගොවි සංවිධානය
36. එච්.චමින්ද කුමාර -උප සභාපති - උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය
37. එච්.එම්.විජේරත්න -උප ලේඛම් - කඩවලවැව බෙදුම් ඇළ ගොවි සංවිධානය
38. එච්.ඒ.සිරිල් කරුණාරත්න -නියෝජිත - සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය
39. ඩබ්.එම්.තිරකරත්න බංඩා -නියෝජිත - ගිරිතලේගම බෙදුම් ඇල ගොවි සංවිධානය
40. යු.ඩී.ආරියරත්න -නියෝජිත - මහසෙන්පුර බෙදුම් ඇල ගොවි සංවිධානය
41. ඩී.එම්.එස්.දසනායක -නියෝජිත - මහසෙන්පුර බෙදුම් ඇල ගොවි සංවිධානය
42. ඩී.ජී.පියරත්න -නියෝජිත - උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය
43. ඩී.එච්.ජයසෝම -නියෝජිත - උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය
44. ටි.ජී.සංජීව ලසන්ත -නියෝජිත - උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය
45. ආර්.ඒ.ප්‍රේමසිරි -නියෝජිත - උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය
46. කේ.පි.දයාවංශ -නියෝජිත - උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය
47. කේ.ඒ.විමලසේන -නියෝජිත - උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය
48. එස්.එම්.ජගත් සමරතුංග -නියෝජිත - උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය
49. ආර්.එම්.විජේරත්න -නියෝජිත - ජයන්තිපුර බෙදුම් ඇල ගොවි සංවිධානය
50. යු.ඩබ්.සෞම්‍යසිරි -ගණන් පරීක්ෂක - නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය
51. එම්.විජේරත්න -ජල පාලක - විජය බෙදුම් ඇල ගොවි සංවිධානය

52. ඩී.එම්.ටී.ජී.ප්‍රේමරත්න -ජල පාලක - ජයන්තිපුර බෙදුම් ඇල ගොවි සංවිධානය
53. කේ. එම්.නවරත්න බංඩා -ජල පාලක - මහසෙන්පුර බෙදුම් ඇල ගොවි සංවිධානය
54. කේ. ජී.හේමචන්ද්‍ර -ජල පාලක - සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය
55. ඩී.ඩී.වීරවංශ -අනුශාසක - ව්‍යාපාර ඒකාබද්ධ ගොවි සංවිධානය
56. ජී. ජී.ටිකිරි බංඩා -කෙත් ඇල නියෝජිත- 48 බෙදුම් ඇළ ගොවි සංවිධානය
57. එච්.ජී. කිරි බංඩා -කෙත් ඇල නියෝජිත-චන්ද්‍රනපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය

## දිස්ත්‍රික් ලේකම් පොළොන්නරුව

- මිනිසාගේ අයහපත් මානව ක්‍රියාකාරකම් නිසා ස්වභාව දහම වෙනස් වී ඇතිබවත් එය කෘෂි කර්මාන්තයට ඉදිරියේදී දැඩිව බලපා ඇති බවත්
- වී වගාව සඳහා වැඩිපුර ජලය භාවිතා කරන රටක් ලෙස ශ්‍රී ලංකාව හැඳින්විය හැකි බවත්
- පවතින ජල සම්පත කළමනාකරණය කිරීමට සියලු දෙනා එක්ව කටයුතු කළ යුතු බවත්
- 2018/19 මහ කන්නයේදී ජල කළමනාකරණය කිරීම තුළ 2019 යල කන්නය සුභදායි ලෙස ආරම්භ කළ හැකි පරිසරයක් ගොඩ නගා ගත හැකි බවත්
- අමතර ජල මුර ඉල්ලීම නවතා ලීමට ගොවි සංවිධාන කටයුතු කළ යුතු බවත් , කන්න රැස්වීම් වලදී ගනු ලබන තීන්දු තීරණ වලට එකගව කටයුතු කිරීමට ගොවීන් හුරු කර ලීමට ගොවි සංවිධාන නිළධාරීන් ඍජුව මැදිහත් විය යුතු බවත්

## 01.2018/19 මහ කන්නය සදහා ජල නිර්දේශ ඉදිරිපත් කිරීම

### ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - මින්නේරිය

- 2018-10-23 දින වන විට ජලාශයේ ධාරිතාව අක්කර අඩි 15656 ක් පවතින බවත්
- 2018 යල් කන්නය සදහා අක්කර අඩි 44898 ක ජල ධාරිතාවක් ජලාශයෙන් නිදහස් කර ඇති බවත්
- මේ වන විට පැවති මහවැලි ජල පාලන කමිටු රැස්වීමේදී 2018-11-10 වන දින ජලය ලබා දීමට තීරණය වුවත් ගිරිතලේ ව්‍යාපාර ඒකාබද්ධ ගරු සභාපති මහතාගේ ඉල්ලීම මත 2018-11-05 දින ජලය නිකුත් කිරීමට එකග වූ බවත්
- මේ වන විට ගිරිතලේ ජලාශයට මොරගහ කන්ද ජලාශයෙන් දිනකට කියුසෙක් අඩි 200 ක ජල ප්‍රමානයක් ලැබෙමින් පවතින බව
- මෙවර 2018/19 මහ කන්නය සඳහා ජලය නිකුත් කිරීම 2018-11-05 දින සුදුසු බවත්
- මේ වන විට ගිරිතලේ ව්‍යාපාරයේ වාරි පද්ධතිය දැඩි ලෙස අබලන් වී ඇති බවත් ඒ සඳහා ලෝක බැංකු ආධාර යටතේ වාරි පද්ධතිය ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රතිපාදන ලැබී ඇති බවත් 2019 මැයි මස වන විට එම මුදල මගින් නඩත්තු කටයුතු සිදු කර අවසන් කළ යුතු බවත් ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වන බවත් එම මුදල් ආපසු යාමට ඉඩ ලබා දිය නොහැකි බවත්, එයට ගොවි සංවිධාන නිළධාරීන්ගේ සහයෝගය ලබා දෙන ලෙසත්

### දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු - පොළොන්නරුව

- 2018/19 මහ කන්නය සඳහා ජලය ලබා දීම 2018-11-10 වන දින තීරණය වුවත් ඒකාබද්ධ ව්‍යාපාර සභාපති තුමන්ගේ ඉල්ලීම මත එය 2018-11-05 දින ලබා දීමට තීරණය වූ බවත්
- දැනට පවතින වර්ෂාවෙන් මූලික බිම් සකස් කිරීමේ කටයුතු සිදු කර ගන්නා ලෙසත්
- වාරි පද්ධතියේ දැනට අරඹා ඇති නඩත්තු කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු සිදු කරන බවත් මෙවර මාස් කන්නය සඳහා නොවැම්බර් 05 ජලය නිකුත් කරනුයේ ගොවි මහතුන්ගේ දැඩි ඉල්ලීම මත බවත්

## 02. යෙදවුම් හා සැපයුම් සම්පාදනය

### ගොවිජන සේවා සහකාර කොමසාරිස්

- මෙවර සහනාධාර පොහොර ගොවීන් වෙත කඩිනමින් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බවත් ගොවි සංවිධානය දක්වාම ප්‍රවාහනය කර දෙන බවත්
- පොහොර ප්‍රවාහනය සඳහා ටෙන්ඩර් ඉල්ලුම්පත් මේ වන විට කැඳවා ඇති බවත්
- ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව මගින් ගොවීන් හට ගොවිජන බැංකු ණය යෝජනා ක්‍රමයක් ලබා දීමට කටයුතු සිදු කරන බවත්
- මෙවර ගොවීන් හට අවශ්‍ය බීජ වී නියමිත වේලාවට ලබා ගැනීමට ගිරිතලේ හා නවනගරය ගොවිජන සේවා මධ්‍යස්ථාන තුළ අවශ්‍ය පහසුකම් සලසා දෙන බවත්

## 03. කෘෂි කර්ම සංවර්ධනය

### නියෝජ්‍ය කෘෂි කර්ම අධ්‍යක්ෂ - අන්තර් පළාත්

- මෙවර මහ කන්නය නියමිත කාලයට ආරම්භ කළ යුතු බවත්
- නොවැම්බර් මාසය තුල වැපිරීම් කටයුතු සිදු කිරීම උචිත බවත්
- වී වගාවේ සාර්ථක අස්වැන්නක් සඳහා ජලය අත්‍යවශ්‍ය සාධකයක් වන බවත්
- මාස 02 දී වී වගාව ප්‍රජනන අවධිය වෙත ගමන් කරන හෙයින් ජලය එම කාලයේදී අත්‍යවශ්‍ය වන බවත්
- නොවැම්බර් මාසය තුළ ජලය ලබා දීමෙන් 2019 මාර්තු 15 වන විට අස්වනු නෙලීම් කටයුතු ආරම්භ කළ හැකි බවත් එම වගාවට වැළදෙන කෘමි හානි පාලනය කිරීමට හැකි වන බවත්

### දිස්ත්‍රික් අලවි නිළධාරි - ලක් පොහොර සමාගම

- මෙවර 2018/19 මහ කන්නය සඳහා ගොවීන්ට අවශ්‍ය පරිදි පොහොර ලබා දිය හැකි බවත්
- මේ වන විට අවශ්‍ය ප්‍රමාණයට පොහොර ගබඩා වෙත රැගෙන විත් අවසන් බවත්
- රජය මගින් අක්කර 01 කට ලබා දී ඇති පොහොර නිර්දේශයට අමතරව පොහොර ලබා දිය නොහැකි බවත්

### නේවාසික ව්‍යාපෘති කළමනාකරු - ගිරිතලේ ව්‍යාපාරය

- 2018/19 මහ කන්නයේ පෙර කන්න තීන්දු තීරණ ඉදිරිපත් කල අතර එය පහත පරිදි සංශෝදනය විය

### 2018 / 19 මහ කන්නයේ කන්න රැස්වීම් තීන්දු තීරණ - ගිරිතලේ ව්‍යාපාරය

1994 අංක 13 දරණ වාරිමාර්ග පනතින් සංශෝධිත 1968 අංක 48 දරණ වාරිමාර්ග ආඥා පනතේ විදිවිධාන අනුව 2018.10.23 වන දින ගිරිතලේ නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල රැස්වීම් ශාලාවේ දී ප.ව 2.00 ට පැවති ගිරිතලේ මහා වාරිමාර්ග බල ප්‍රදේශයේ 2018 /19 මහ කන්න වගා රැස්වීමේදී පහත තීරණ වලට එළඹෙන ලදි.

| | වගා කරන බෝග වර්ගය | වී මාස 3 - 3 ½ / අතිරේක බෝග |
|---|---|---|
| | වගා කරන බිම් ප්‍රමාණය (රක්ෂිත හා ගොඩ ඉඩම් හැර) | හෙක්ටයාර් 2617 |
| 01. | ගොවීන් විසින් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2018.11.01 පෙර |
| 02. | ගොවි සංවිධාන විසින් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2018.11.03 පෙර |
| 03. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රධාන ඇල නඩත්තු වැඩ අවසන් කළ යුතු දිනය | 2018.11.03 පෙර |

| | | |
|---|---|---|
| 04. | පළමු ජල මුරය නිකුත් කරන දිනය | 2018.11.05 |
| 05. | වගාව පිහිටවා අවසන් කළ යුතු දිනය | 2018.11.30 |
| 06. | මුර ජලය ආරම්භ කරන දිනය | 2018.12.03 |
| 07. | ට්‍රැක්ටර් හා ගවයන් යායෙන් ඉවත් කළ යුතු දිනය | 2018.11.30 |
| 08. | වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය | 2018.11.30 |
| 09. | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2019.03.31 |
| 10. | අවසන් වරට මුර ජලය නිකුත් කරන දිනය | 2019.03.17 |

1968 අංක 48 වාරිමාර්ග පනතේ 11 වන වගන්තියේ 1 හා 2 උප වගන්ති අනුව කන්නයට අදාළව සකස් කර ගන්නා රීති

01. වාරි ජලය ලබාගෙන දුම්කොළ වගා කිරීම සපුරා තහනම්.

02. ගොවි සංවිධාන නඩත්තු අරමුදල සඳහා වගා කරනු ලබන සෑම අක්කර 1 ක් සඳහාම රු.200.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය. එම මුදල ගොවි සංවිධානයේ නඩත්තු හා මෙහෙයුම් අරමුදලට බැර කළ යුතුය.

03. නියමිත දිනට ඇල වේලි ශුද්ධ නොකරන ගොවින්ගෙන් එම ඇල වේලි ශුද්ධ කිරීම සඳහා බඹයකට රු 250.00 ක මුදලක් අය කර ගැනීමට ගොවි සංවිධානයට අවසර දෙනු ලැබේ.

04. පිදුරු ගිනි තැබීම සපුරා තහනම් වන අතර එය කාබනික පොහොරක් ලෙස පසට එකතු කළ යුතුය. මෙම තීරණය කඩ කරන්නන්ගෙන් අක්කරයකට රු.3,000.00 දඩ මුදලක් අය කර ගැනීමට හා නීත්‍යානුකූලව කටයුතු කිරීමට ගොවි සංවිධානයට බලය දෙනු ලැබේ.

05. ගවයන් සහ ට්‍රැක්ටර් වාරිමාර්ග ඇලට ඇතුළු කිරීම සපුරා තහනම් වන අතර එසේ කළහොත් හානි වන ඇල වල් සහ නිර්මිත සඳහා වාරිමාර්ග ඉංජිනේරුගේ තක්සේරු මුදල ගොවි සංවිධානය විසින් අය කරනු ලැබේ.

06. ඇලවේලි/නිර්මිත හෝ වාරි පද්ධතියේ උපාංග වලට හානි කරන පුද්ගලයින් නීතිය ඉදිරියට පැමිණවීමට වාරිමාර්ග ආඥා පනතේ 23 වන වන්තිය ප්‍රකාරව ගොවි සංවිධාන වෙත බලය පවරා ඇති අතර එකී පනතේ viii කොටසේ 93 වන වගන්තිය අනුව වැරදිකරුවන්ට මහේස්ත්‍රාත් අධිකරණයකදී කරනු ලබන ලඝු නඩු විභාගයකින් අනතුරුව දඬුවමට ලක්වනු ඇත.

07. වාරි ජලයට අපද්‍රව්‍ය / විෂ එක් කරන තැනැත්තන් සම්බන්ධයෙන් 2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනතේ 84(1) වගන්තිය ප්‍රකාරව වරදකරුවන් දඬුවමට ලක්වනු ඇත.චූදිතයන් නීතිය හමුවට පැමිණවීමට ගොවි සංවිධාන නියෝජිතයන් හට බලය පවරණු ලැබේ.

08. ඇල සහ මාර්ග රක්ෂිත වගා කිරීම සපුරා තහනම්

09. අනවසරයෙන් බට දමා වාරි ජලය ලබා ගැනීම සපුරා තහනම්

10. නඩත්තු අරමුදල් නොගෙවන නිසි පරිදි ඇල වේලි ශුද්ධ නොකරන සාමාජිකත්වය ලබා නොමැති ගොවීන්ගේ පොහොර සහනාධාරය නිර්දේශ නොකිරීමට ගොවි සංවිධානයට හැකි වේ.

11. මෙම කන්න රැස්වීමේ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ගොවි සංවිධානය වෙත පවරා ඇති අතර ගොවි සංවිධානය වෙනුවෙන් ක්‍රියාකරන ගොවි නියෝජිතයන් හෝ ජල පාලකවරු රාජකාරියෙහි

නියැලෙන විට බාධා කිරීමක්, ඉඩ නොදීමක්, පරිබව කිරීමක් හෝ හිංසා කිරීමක් සිදු කිරීම අධිකරණයේ දී රාජකාරියට බාධා කිරීමේ වරදට වරදකරු වේ. ඒ සඳහා වාරිමාර්ග ආඥා පනතේ 95 වන වගන්තිය හා 2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනතේ 72 වන වගන්තිය ප්‍රකාරව නීතිමය රැකවරණය සලසා ඇත.

12. අමතරව ජල මුරයක් ලබා දීම සඳහා ජලය ලබා ගන්නා ගොවි මහතුන්ගෙන් අක්කර 01 සඳහා රු.500ක මුදලක් අය කරන බවත්, ඒ වන විට වගාවේ 25% පමණ තිබෙන බවට ගොවි සංවිධානය විසින් තහවුරු කිරීම.

13. අනපේක්ෂිත ලෙස අයහපත් කාලගුණික තත්වයක් හෝ කිසියම් පාලනය කළ නොහැකි බාහිර උපද්‍රවයන් ඇති වූ විට මෙම තීන්දු තීරණ සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව සතු විය යුතු බව.

14. මෙම කන්න තීරණ සම්බන්ධයෙන් යම් සඳහනක් පිළිබඳව අර්ථ නිරූපණය කිරීමේ බලය පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් සතුය.

- මහ කන්න රැස්වීමේ තීරණ යෝජනා කිරීම - සභාපති ව්‍යාපාර ඒකාබද්ධ ගොවි සංවිධානය එච්.ඒ.ඩී.ශාන්ත ගුණසේකර
- මහ කන්න රැස්වීමේ තීරණ ස්ථිර කිරීම - ලේකම් ව්‍යාපාර ඒකාබද්ධ ගොවි සංවිධානය පි.ආර්.ජයරත්න

| ඉදිරිපත් කල අය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| සභාපති, කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය | පසුගිය 2018 යල කන්නය සාර්ථක කර ගැනීමට රේඛීය ආයතන හා දෙපාර්තමේන්තු දැක්වූ සහයෝගය පිළිබඳ තමා ගිරිතලේ ව්‍යාපාරය වෙනුවෙන් තම ස්තූතිය පුද කරන බවත් | - | ගො.සං |
| | මේ වන විට වාරි මාර්ග දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති ප්‍රතිපාදන මගින් සිදු කරන නඩත්තු කටයුතු සඳහා ප්‍රමානවත් කාලයක් අවශ්‍ය බවත් | අවශ්‍ය නඩත්තු කටයුතු කඩිනමින් සිදු කිරීමට සියලු ගොවි සංවිධාන සහය ලබා දීම | වා.දෙ<br>ගො.සං |
| | 2018/19 මහ කන්නය සඳහා ගිරිතලේ ජලාශයෙන් ජලය නිකුත් කිරීම 2018-11-05 දින සුදුසු බවත් | ව්‍යාපාරයේ ගොවි සංවිධාන ඒකමතිකව සහය ලබා දීම | වා.දෙ<br>ගො.සං |
| | මෙවර කන්නයේදී අමතර ජල මුර නිදහස් කිරීම නතර කරන ලෙසත් | කන්න රැස්වීම් තීරණ වලට අනුව තීරණ ගැනීම | වා.දෙ<br>ගො.සං |
| | මෙවර මහ කන්නයේ කුඹුරු ඉඩම් වල දුම්කොළ වගාව නතර කරන ලෙසත් | ඒ සඳහා වාරි ජලය ලබා දීම සිදු නොකිරීමටත් පොහොර සහනාධාර ලබා නොදීමටත් තීරණ ගැනීම | වා.දෙ<br>ගොවි.සේ.දෙ |

| | | | |
|---|---|---|---|
| | ඉදිරියේදී පවත්වන කන්න රැස්වීම් සදහා අදාල පරිදි පොලිසිය සම්බන්ධ කළ යුතු බවත් | ඉදිරියේදි පොලිස් නිළධාරීන් සම්බන්ධ කිරීම | දි.ලේ |
| | ගොවි සංවිධාන බල ප්‍රදේශ වල ඇති දැනට භාවිතා නොකරන සමූපකාර දෙපාර්තමේන්තුවට අයිති ගබඩා සංකීර්ණ ගොවි සංවිධාන වෙත ලබා දෙන ලෙසත් | ප්‍රයෝජනයට නොගන්නා ගබඩා වල විස්තර ලබා දීම | ගො.සං<br>දි.ලේ |
| උපදේශක, ව්‍යාපාර ගොවි සංවිධානය | රජය විසින් ලබා දෙන පොහොර නිර්දේශයට අමතර පොහොර ලබා ගත හැකිද යන්න | ලබා දී ඇති පොහොර නිර්දේශයට අමතරව පොහොර ලබාදිය නොහැකි බව | ගො.සෙ<br>දෙපා |
| | සමස්ථ දිස්ත්‍රික්කය තුල ඇති සියලුම ව්‍යාපාර එක්ව වගා කටයුතු ආරම්භ කිරීමේදී ප්‍රායෝගික ගැටලු රාශියකට ගොවීන් මුහුණ දෙන බවත් | - | - |
| | මේ වන විට ගොවීන් දැඩි ලෙස අසණ වී ඇති හෙයින් වී පොරොන්දුව මත වාරික ගෙවූ විට කුඹුරු නිදහස් වන පරිදි ණය යොජනා ක්‍රමයක් සකසා දෙන ලෙසත් | ඉදිරියේදී අවශ්‍ය පරිදි කටයුතු කිරීම | ගොවි.සේ.දෙ |
| | පසුගිය කන්නය තුළ ඇති වූ බාධක හමුවේ ගොවීන් සමග සුහදව කටයුතු කළ හිටපු දිස්ත්‍රික් ලේකම් තුමන් වන රංජිත් ආරියරත්න මහතා හට සිය ස්තූතිය පුද කරනු ලබන බවත් | සියලු ගොවි සංවිධාන ස්තූතිය පුද කිරීම | ගො.සං |
| | පසු ගිය කන්නයේ ලැබූ අමිහිරි අත්දැකීම් සැලකිල්ට ගෙන මෙවර කන්නය සැලසුම් කළ යුතු බවත් | - | ගො.සං |
| | ඉදිරි 2019 යල කන්නය ගැන සුභවාදීව ආරම්භ කිරීමට නම් මෙවර මහ කන්නය තුළ ක්‍රමවත් ජල කළමනාකරණයක් සිදු කර ගත යුතු බව | - | ගො.සං |
| | පසුගිය කන්නයේ වී වගාවට වැළදුනු කෘමි හානිය නිසා ව්‍යාපාරය තුළ අක්කර 2926 කට පමණ හානි සිදු වූ බවත් | ඉදිරියේදී එවැනි හානි වලින් වගාව මුදවා ගැනීමට කටයුතු කිරීම | කෘ.දෙ<br>ගො.සං |
| | කන්න රැස්වීමේදී ගනු ලබන තීරණ වලට සියලු ගොවීන් අවනත විය යුතු බවත් | කන්න තීරණ කඩ කරන්නන් හට දඬුවම් කිරීම | වා.දෙ<br>දි.ලේ<br>ගො.සං |

| | | | |
|---|---|---|---|
| ලේකම්, කඩවල වැව බෙදුම් ඇල ගොවි සංවිධානය | මේ වන විට ගොවීන් අසරණ තත්වයට පත්ව ඇති හෙයින් අවශ්‍යතාවය මත අමතර ජල මුරයක් ලබා දීම සුදුසු බව | ඒ වන විට ක්ෂේත්‍රයේදී 25% ක පමණ වගාව පැවතුන විට ඒ පිළිබඳ සලකා බැලිය යුතු බව | වා.දෙ<br>දි.ලේ |
| | මෙවර ක්‍රීඩ හානිය පිළිබඳ තොරතුරු කෘ.ප.නි.ස මහතුන් ලබා ගත්තද මේවන තෙක් ගොවීන් හට සහනයක් ලැබී නොමැති බව | ඉදිරියේදී අවශ්‍ය වු විට අවශ්‍ය කටයුතු සිදු කිරීම | දි.ලේ<br>ගොවි.සේ.දෙ |
| ලේකම්, පැරණි ජනපද බෙදුම් ඇල ගොවි සංවිධානය | තම ගොවි සංවිධාන බල ප්‍රදේශයට ජලය ගමන් ගන්නා ඇල කොන්ක්‍රීට් කළද මේ වන විට එම බැම්ම පුපුරා ඇති බැවින් fc 10 කෙත් ඇලට අදාල පාර කැඩී ගොස් ඇති බවත් වුඩ් සයිඩ් එක අසල බට දෙක තවමත් ඉවත් කර නොමැති බවත් | ක්ෂේත්‍ර පරීක්ෂාවකින් පසු මෙවර කන්නය ආරම්භ කිරීමට ප්‍රථම කොන්ත්‍රාත් කරුට දැනුම් දී ගැටලුව විසදීමට කටයුතු කිරීම | වා.දෙ<br>ගො.සං |
| සභාපති, සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය | පසුගිය කන්නයේ ව්‍යාපාරය තුළ දුම්කොළ වගා කිරීමට ගොවීන් පෙළඹී ඇත්තේ කුඹුරු සඳහා වාරි ජලය ලබා ගත නොහැකි තත්වයත් උද්ගතව පවතී | අවශ්‍ය පරිදී කුඹුරු ඉඩම් පහත් කර ගැනීමට අවශ්‍ය සහය ලබා දීම | දි.ලේ<br>ප්‍රා.ලේ<br>ගො.සං |
| භාණ්ඩාගාරික, උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය | ගොවීන් හට වී වේලීම පොදු කමත් ඉදි කර දෙන ලෙස | මේ සඳහා සුදුසු ඉඩම් වල තොරතුරු ලබා දීම | දි.ලේ<br>ගො.සං |
| | දැනට ගොවි මහතුන් හට වී සඳහා ඉහළ මිලක් ලබා දිය යුතු බව | - | - |
| සභාපති, උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය | රජරට නවෝදය වැඩ සටහන යටතේ තම ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළ LB-01 කෙත් ඇලෙහි පහළ කොටස හා RB-03 කෙත් ඇලෙහි පහළ කොටස ප්‍රතිසංස්කරණය කර ගැනීමට ඉල්ලීම් කර ඇති බවත් එයට අවශ්‍ය මැනුම් කටයුතු සිදු කළ යුතු බව | අදාල පරිදි මැනුම් කටයුතු සිදු කර ගැටලු මතු වු විට ඒ පිළිබඳ වාර්ථාවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමු කිරීම | වා.දෙ<br>දි.ලේ<br>ගො.සං |
| යාය නියෝජිත, සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය | මෙවර සහනාධාර පොහොර ගොවීන් වෙත ලබා දීමේදී ප්‍රවාහනය හා බෑම ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් සිදු කරනවාද යන්න | ප්‍රවාහනය හා බෑම ගොවිජන සේවා දෙපාර්ථමේන්තුව මගින් සිදු කරීම | ගොවි.සේ.දෙ<br>ගො.සං |
| | ගොවි සංවිධාන බහුතයකට ගබඩා පහසු කම් නොමැති බව හා නියමිත දිනට පොහොර ගැනීමට ගොවීන් නොපැමිණෙන බවත් | ගබඩා කුලියට ලබා ගැනීම හා නිශ්චිත දැනුම්දුන් දින 02 ක් ඇතුළත ගොවීන් පොහොර ලබා නොගත හොත් වගකීමෙන් ඉවත් වීම | ගො.සං |

| | | | |
|---|---|---|---|
| | දැනට අක්කර - 01 ක් සඳහා ලබා දෙන පොහොර නිර්දේශය ප්‍රමාණවත් නොවන බව | - | - |
| | පෞද්ගලික වෙළඳුන් අධික මිලට පොහොර ලබා දීම පාලනය කරන ලෙසත් | ඉදිරියේදී අවශය පරිදි කටයුතු කිරීමට අදාල අමාත්‍යාංශය දැනුවත් කිරීම | දි.ලේ |
| **වෙනත්** | | | |
| සභාපති, කඩවල වැව බෙදුම් ඇල ගොවි සංවිධානය | දැනට ක්‍රියාත්මක වන එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා ණය වැඩ සටහන යටතේ ගොවීන් හට ට්‍රැක්ටර් පමණක් නොව අනෙක් පහසු කම් ලබා දීමට කටයුතු කර දෙන ලෙස | අවශ්‍ය පරිදි කටයුතු කිරීම | දි.ලේ |
| | 2018-11-05 වන දින ගිරිතලේ ජලාශය අභියස කිරි ඉතිරවීමේ මංගල්‍ය පැවැත්වීමට කටයුතු සූදානම් කරන බවත් ඒ සඳහා සියලුම රාජ්‍ය නිළධාරීන්ගේ සහභාගීත්වය තමා බලා පොරොත්තු වන බවත් | ගොවි සංවිධාන 15 හිම සහය ලබා දීම | ගො.සං |

**Bio film - කාබනික දියරපොහොර (ජාතික මූලික අධ්‍යයන ආයතනය)**

- ❖ වී ගොවි තැනට භාවිතා කරන රසායනික පොහොර 50% කින් පමණ අඩු කිරීමේ හැකියාව බයෝ පොහොර භාවිතා කිරීමෙන් හැකි වන බව
- ❖ වී වගාවේ අස්වැන්න 19% හා 20% පමණ වැඩි කර ගත හැකි බව
- ❖ වර්ථමානයේ වැළදෙන වකුගඩු පිළිකා රෝග වලට මුහුණ දීමේ අවදානම අඩුකර ගත හැකි බව

2018-10-23 දින පැවති 2018/19 මහ කන්න රැස්වීමේදී දිස්ත්‍රික් ලේකම් තුමන් ඇතුලු සියලු රාජ්‍ය නිළධාරීන්ට හා කෙත් ඇල නියෝජිතයන් හට ස්තූතිය ප්‍රකාශ කිරීම නේවාසික ව්‍යාපෘති කළමනාකාර තුමන් විසින් සිදු කරන ලදි.

පණ්ඩුක එස්.පී. අබේවර්ධන
දිස්ත්‍රික් ලේකම් දිසාපති
පොළොන්නරුව

පණ්ඩුක එස්. පී. අබේවර්ධන
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
පොළොන්නරුව

පිටපත්

1. ලේකම් - වාරිමාර්ග ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - කා.දැ.පි
2. අධ්‍යක්ෂ ජෙනරාල් - වාරිමාර්ග දෙපාර්ථමේන්තුව - කා.දැ.පි
3. අධ්‍යක්ෂ - වාරිමාර්ග කළමනාකරණ අංශය - කා.දැ.පි
4. සභාගි වූ සියලු රාජ්‍ය නිළධාරීන් සඳහා